සියලුම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

Learning Resource Centre
De Mazenod College
Kandana

වර්ෂ අවසාන ඇගයීම - 2024 (2025)
ஆண்டிறுதி மதிப்பீடு - 2024 (2025)
Year End Evaluation - 2024 (2025)

| | | |
|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 07 | විෂයය / பாடம் / Subject: ඉතිහාසය | පත්‍රය / வினாத்தாள் / Paper: I/II |
| කාලය / காலம் / Time: පැය 2 | | |

නම / பெயர் / Name: ..................

විභාග අංකය / சுட்டிலக்கம் / Index No.: ..................

සැළකිය යුතුයි.

- I කොටසේ ප්‍රශ්න සියල්ලටම මෙම පත්‍රයේ ම පිළිතුරු සපයන්න.
- I කොටසේ 01 සිට 20 දක්වා ඇති ප්‍රශ්න සියල්ලට ම නිවැරදි පිළිතුරට යටින් ඉරක් අඳින්න.

## I කොටස

01. අතීතයේ අප රටේ ජීවත් වූ ජනතාව කෘෂිකර්මාන්තය ප්‍රධාන ජීවන වෘත්තිය ලෙස තෝරා ගැනීමට බලපෑ ප්‍රධාන හේතුවක් වූයේ මින් කුමක් ද?
    (1) ඔවුන් ඉතා සරළ ජීවිත ගත කිරීම.
    (2) ගම මූලික කරගෙන ජීවත් වීම.
    (3) යැපීම සඳහා අවශ්‍ය ආහාර පාන නිෂ්පාදනය කර ගැනීම.
    (4) අවශ්‍යතා සීමිත වීම.

02. අතීත සෙල්ලිපිවල "පිටබිම්" යනුවෙන් හඳුන්වා ඇත්තේ,
    (1) කුඹුරු ගොවිතැන යි. (2) සත්ත්ව පාලනය යි. (3) හේන් ගොවිතැන යි. (4) ධීවර කර්මාන්තය යි.

03. මහාවංසයේ සඳහන් පරිදි දොරමඬලාව නම් ගමේ ළමා කාලය ගත කර ඇති රජතුමා කවුරුන් ද?
    (1) කාවන්තිස්ස රජු (2) පණ්ඩුකාභය රජු (3) දුටුගැමුණු රජු (4) මහසෙන් රජු

04. සාලිය කුමරුගේ බිසව වූ අශෝකමාලා රසවත් ආහාර පිළියෙල කළ බව සඳහන් මූලාශ්‍රය කුමක් ද?
    (1) සද්ධර්මාලංකාරය (2) මහාවංසය
    (3) සහස්සවත්ථුප්පකරණය (4) අඹගමුව සෙල්ලිපිය

05. අනුරාධපුර රාජධානි අවධියේ රජකළ අටවන අග්ගබෝධි රජතුමා පිළිබඳ නිවැරදි ප්‍රකාශය තෝරන්න.
    (1) වෙස්වලාගෙන කුඹුරක අස්වනු නෙළීමට සහභාගි වූ බව.
    (2) තම මවට ඇප උපස්ථාන කළ බව.
    (3) උඳු වැපිරීමට හේනක් සකස් කළ බව.
    (4) වෙළෙඳපලක පාලනයට නීති පැනවූ බව.

06. අධිෂ්ඨානශීලීව හා ඉවසිලිවන්තව කටයුතු කිරීමෙන් තම අරමුණ ජයගත හැකි බව පෙන්වා දුන් පාලකයකු වන්නේ,
    (1) දෙවන දප්පුල රජතුමා ය (2) පළමුවන සේන රජතුමා ය
    (3) මානවම්ම රජතුමා ය (4) නවවන අග්ගබෝධි රජතුමා ය

07. දකුණු ඉන්දියානු රාජ්‍ය අතරින් ශ්‍රී ලංකාවට ඉතා සමීපව පිහිටා තිබූ රාජ්‍ය වූයේ,
    (1) චෝල දේශය (2) කාලිංගය (3) පල්ලව (4) පාණ්ඩ්‍ය

08. අනුරාධපුර යුගය අවසාන භාගයේ දී රජවරු "අන්තානි කනු" යනුවෙන් ශිලා ලිපිවල සඳහන් කර ඇත්තේ,
    (1) අපරාධ නඩු විසඳීමට අදාළ නීතිය (2) රාජකීය දීමනා පිළිබඳව ය.
    (3) මූල්‍ය කළමනාකරණය පිළිබඳව ය. (4) ප්‍රාදේශීය පාලනය පිළිබඳව ය.

09. පනාකඩුව තඹ සන්නසෙ සඳහන් වන, කිත්ති කුමරුට රැකවරණය ලබා දුන් සෙන්පතියා කවුරුන් ද?
(1) බුද්ධරාජ (2) දේවපතිරාජ (3) නගරගිරිකිත්ති (4) ලංකාපුර

10. කාලිංග වංශිකයෙකු වීමත්, විදේශයක උපන් අයෙකු වීමත් නිසා අභියෝග රැසකට මුහුණ දුන් පොළොන්නරු පාලකයා කවුරුන් ද?
(1) මහා පරාක්‍රමබාහු රජු (2) මහා විජයබාහු රජු (3) නිශ්ශංකමල්ල රජු (4) දෙවන විජයබාහු රජු

11. අනුරාධපුර රාජධානිය පාලනය කළ භාතිකාභය රජතුමා රුවන්වැලි සෑය අලංකාර කිරීමට පබළු ගෙන්වා ගත්තේ කුමන රටෙන් ද?
(1) චීනය (2) ග්‍රීසිය (3) අරාබිය (4) රෝමය

12. ස්වභාවික ලෙනක් තුළ පිහිටි බෞද්ධ විහාරයක් වීමත්, විශිෂ්ට සිතුවම් දක්නට ලැබීමත් නිසා ලෝක උරුම ලැයිස්තුවට ඇතුළත් වූ ස්ථානයක් වන්නේ,
(1) දඹුලු රජමහා විහාරය ය. (2) ඉසුරුමුණි විහාරය ය. (3) දළදා මාලිගාව ය. (4) සීගිරිය ය.

13. වෙස් මුහුණු කර්මාන්තය සඳහා ප්‍රසිද්ධියට පත් අම්බලන්ගොඩ හා උඩුපිල වැනි ගම්මාන අයත් වන්නේ ශ්‍රී ලංකාවේ කුමන පළාතට ද?
(1) බස්නාහිර (2) දකුණු (3) වයඹ (4) නැගෙනහිර

14. පහත දැක්වෙන පිළිතුරු කාණ්ඩ අතුරින් ස්පෘශ්‍ය උරුම පමණක් දැක්වෙන පිළිතුර තෝරන්න.
(1) චාරිත්‍ර වාරිත්‍ර, රජ මාළිගා, ජන ගීත (2) පැරණි පොත්, රජමාළිගා, ඇදහිලි හා විශ්වාස
(3) බලකොටු, රජමාළිගා, පැරණි පොත් (4) බලකොටු, පැරණි පොත්, විවිධ කෙම් ක්‍රම

15. පොළොන්නරුව රාජධානිය පරිහානියට පත් වීමෙන් පසු රුහුණේ ගෝවින්ද මලය ප්‍රදේශයේ බලකොටුවක් තනාගෙන රට ආරක්ෂා කරගත් නායකයා කවුරුන් ද?
(1) බුවනෙකබාහු ආදිපාදතුමා (2) හතරවන විජයබාහු (3) සුභ සෙනෙවි (4) සංඛ සෙනෙවි

16. බෙලිගල දළදා මැඳුරක් ඉදිකොට දඹදෙණිය තම රාජධානිය බවට පත් කරගත් රජතුමා කවුරුන් ද?
(1) හතරවන බුවනකබාහු රජතුමා (2) තුන්වන විජයබාහු රජතුමා
(3) පස්වන බුවනෙකබාහු රජතුමා (4) හතරවන පරාක්‍රමබාහු රජතුමා

17. පාලි භාෂාවෙන් ලියා තිබූ පන්සිය පනස් ජාතක පොත සිංහලයට පරිවර්තනය කිරීම සිදුවූයේ කුමන රාජධානි යුගයේ ද?
(1) යාපහුව (2) කුරුණෑගල (3) ගම්පොල (4) කෝට්ටේ

18. සුප්‍රසිද්ධ ග්‍රීක වීර කාව්‍ය දෙකක් වන ඉලියඩ් සහ ඔඩිසි රචනා කළ කතුවරයා කවුරුන් ද?
(1) හෝමර් (2) වර්ජිල් (3) ප්ලේටෝ (4) ආකිමිඩීස්

19. ඉතාලිය සෙසු යුරෝපා රටවලින් වෙන්වන කඳුවැටිය කුමක් ද?
(1) ඇපනයින් (2) ඔලිම්පස් (3) ඇල්ප්ස් (4) එඩ්නා

20. ඇතැන්ස් රාජ්‍යයේ ස්වර්ණමය යුගය ලෙස සැළකෙන්නේ කුමන පාලකයාගේ කාලය ද?
(1) රොමියුලස් (2) පිලිප් (3) මහා ඇලෙක්සැන්ඩර් (4) පෙරික්ලීස්

(ලකුණු 2 x 20 = 40)

## II කොටස

සැළකිය යුතුයි:

- පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.
- අනෙකුත් ප්‍රශ්න අතුරින් හතරක් තෝරාගෙන පිළිතුරු සපයන්න.
- පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න ගණන පහකි.

---

01. පහත A හා B දක්වා ඇති පින්තූර අධ්‍යයනය කොට අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.



A

අ. i. A පින්තූරයෙන් දැක්වෙන නිර්මාණය නම් කරන්න.
ii. මෙය කුමන ශිෂ්ටාචාරයකට අයත් ද?
iii. මෙම නිර්මාණය ඉදිකොට ඇත්තේ කුමන දෙවඟන උදෙසා ද?
iv. මෙය නිර්මාණය කිරීමේ දී අමුද්‍රව්‍ය ලෙස යොදා ගත් දේවල් අතුරින් එකක් ලියන්න.



B

ආ. i. A රූපයෙන් දැක්වෙන්නේ කුමක් ද?
ii. මෙය ප්‍රථම වරට ගොඩනැගූ ජාතීන් කවුරුන් ද?
iii. මෙය ආරක්ෂක බලකොටුවක් ලෙස වඩා ශක්තිමත්ව ගොඩනගාගත් ජාතිය කවුද?
iv. මෙම ස්ථානයේ දක්නට ලැබෙන ස්මාරක කුමන ගෘහ නිර්මාණයකට අයත් ද?

(ලකුණු 2 x 8 = 16)

02. i. අතීතයේ හේන්වල වගා කරන ලද ඇල් වී වර්ග දෙකක් නම් කරන්න. (ලකුණු 02)
ii. අතීත හේන් වගාවේ දී ගොවියා භාවිත කළ පහත සඳහන් වචනවල අදහස A, B අනුපිළිවෙළින් ලියා දක්වන්න.
A - නව දැළි හේනː -
B - ගිනි යාතිකාවː - (ලකුණු 04)
iii. අතීත සත්ත්ව පාලනයේ දී ගව පාලනය වඩාත් ප්‍රචලිතව පැවති අතර එමගින් ලබාගත් ප්‍රයෝජන 5ක් ලියන්න. (ලකුණු 05)

03. i. මෙරට වෙළඳාමේ යෙදී සිටි විදේශ වෙළෙඳ සංවිධාන දෙකක් නම් කරන්න. (ලකුණු 02)
ii. හෝපිටිගම වෙළෙඳපොළ සම්බන්ධ බදුලුටැම් ලිපියේ සඳහන් නීති දෙකක් සඳහන් කරන්න. (ලකුණු 04)
iii. විදේශ වෙළෙඳාම සම්බන්ධ පහත තොරතුරු ලියන්න.
A - ශ්‍රී ලංකාව සමග වෙළෙඳ සබඳතා පැවැත් වූ රටවල් දෙකක් -
B - අතීතයේ මෙරටට ගෙන්වන ලද වෙළෙඳ භාණ්ඩ දෙකක් -
C - විදේශ වෙළෙඳාමේ දී වැදගත් වූ මෙරට වරායක් -
(ලකුණු 05)

04. i. පහත තොරතුරු හා සම්බන්ධ රජවරු නම් කරන්න.

A - සෑම ගම් දහයකට ම වෛද්‍යවරයකු බැගින් පත්කොට වෙදහල් කරවීම -

B - අන්ධයන් හා රෝගීන් සඳහා ආරෝග්‍යශාලා හා දාන ශාලා පිහිටුවීම - (ලකුණු 02)

ii. අනුරාධපුර යුගයේ බහුල වශයෙන් පැවැති රජකම උරුම වීමේ ක්‍රම දෙක සඳහන් කරන්න. (ලකුණු 04)

iii. මහා පරාක්‍රමබාහු රජතුමා බුදු සසුනේ අභිවෘද්ධිය උදෙසා සිදු කළ සේවාවන් කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)

05. i. පොළොන්නරුව නගරය තුළ දක්නට ලැබෙන බෞද්ධ ස්මාරක හා හින්දු ස්මාරක එක බැගින් ලියන්න. (ලකුණු 02)

ii. සීගිරියේ දක්නට ලැබෙන විශිෂ්ට නිර්මාණ හතරක් සඳහන් කරන්න. (ලකුණු 04)

iii. අපේ සංස්කෘතික උරුම රැක ගැනීමේ වැදගත්කම කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)

06. i. පොළොන්නරුව රාජධානිය බිඳ වැටීම සම්බන්ධව පහත තොරතුරු ලියන්න.

A - ක්‍රි: ව: 1215 පොළොන්නරුව ආක්‍රමණය කළ ආක්‍රමණිකයා:-

B - එකල පොළොන්නරුව පාලනය කළ රජතුමා:- (ලකුණු 02)

ii. පහත සඳහන් තොරතුරුවලට අදාළ පිළිතුරු A, B, C, D අනුපිළිවෙළින් ලියන්න.

A - ගඩලාදෙණිය විහාරය ඉදිකළ රජතුමා:-

B - යාපහුවේ දළදා මාළිගයක් ඉදිකළ රජතුමා:-

C - චන්ද්‍රභානු නම් ආක්‍රමණිකයා පරාජයට පත් කළ රජතුමා:-

D - කෝට්ටේ බලකොටුවක් ඉදිකළ ඇමතිවරයා:- (ලකුණු 04)

iii. කෝට්ටේ රජකළ හයවෙනි පරාක්‍රමබාහු රජුගේ සේවාවන් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 05)

07. i. රෝමය පාලනය කළ කීර්තිමත් පාලකයින් දෙදෙනෙකු නම් කරන්න. (ලකුණු 02)

ii. පහත තොරතුරුවලට අදාළ පිළිතුරු A, B, C, D අනුපිළිවෙළින් ලියන්න.

A - ග්‍රීසියේ පැවති නගර රාජ්‍ය හැඳින් වූ නම:-

B - බටහිර වෛද්‍ය විද්‍යාවේ පියා ලෙස සැලකෙන පුද්ගලයා:-

C - රෝම නගරයේ ඉදිකර ඇති එළිමහන් ක්‍රීඩා පිටිය:-

D - රෝමවරුන් ඇදහූ සියලු දෙවිවරු වෙනුවෙන් ඉදිකළ දේවස්ථානය:- (ලකුණු 04)

iii. ග්‍රීක ශිෂ්ටාචාරයෙන් ලොවට උරුම වූ දායාද දෙකක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)


පොත් 3 ක් ගත්තොත්,
1 ක් නොමිලේ.
25% දක්වා වට්ටම් හිමිකරගන්න.
හොඳම පොත් අඩුම මිලට අපෙන් විතරමයි...
දැන්ම lol.lk වෙත පිවිසෙන්න
Atlas
Richard
RATHNA EXERCISE BOOKS
CASH ON DELIVERY
VISA
mastercard
KOKO
LOL.LK
LOL STORE (PVT) LTD
COD
CASH ON DELIVERY
037 20 60 110
071 77 74 440

# 7 ශ්‍රේණිය කෙටි සටහන් පොත් Short Notes




Rs : 300




Rs : 300




Rs : 300




Rs : 300




Rs : 300




Rs : 300




Rs : 300




Rs : 300

7 ශ්‍රේණිය ඉංග්‍රීසි මාධ්‍ය කෙටි සටහන් පොත්

English Medium Short Notes




Rs : 180




Rs : 180

මෙම කෙටි සටහන් පොත් සකස් කොට ඇත්තේ ජාතික අධ්‍යාපන ආයතනය මගින් සම්පාදනය කොට ඇති නව විෂය නිර්දේශය අනුව, විෂය ප්‍රවීණත්වයෙන් යුත් සම්පාදක මණ්ඩලයක් විසිනි, එහෙයින් මෙහි අන්තර්ගත සියලු සටහන් එම විෂය නිර්දේශයේ සෑම මාතෘකාවක්ම ආවරණයකොට තිබේ. මෙම ග්‍රන්ථ සම්පාදනය කිරීමේ දී පූර්ණ අවධානය යොමුකොට ඇත්තේ සිසුන්ට මෙන්ම ගුරුවරුන්ට ද අවශ්‍යයෙන්ම මතකයේ තබා ගත යුතු සියලු කරුණු අන්තර්ගත කරමින් වන හෙයින් වෙනත් අතිරේක ග්‍රන්ථ පරිහරණයකින් තොරව වුවද අදාල විෂය නිර්දේශයේ වැදගත් කරුණු සියල්ල ඉතා පහසුවෙන් හැදෑරීමේ මෙන්ම මතකයේ රඳවා ගැනීමේ හැකියාව ද ලැබෙනු ඇත.

LOL.LK
LOL STORE (PVT) LTD
CASH ON DELIVERY
VISA
mastercard
KOKO
037 20 60 110
071 77 74 440
Buy Now
CLICK HERE